# සිංහල නාට්‍යය හා සංස්කෘතික පසුබිම

## හැඳින්වීම

ලක්දිව නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳ ව වැඩි දෙනාගේ පිළිගැනීම වන්නේ ථෙරවාද බුද්ධසමය නිසා ලක්දිව නාට්‍ය කලාවක් පහළ නො වුණු බව ය. එසේ වුව ද ශ්‍රී ලංකාවත් භාරතයත් අතර වූ සමීප සබඳතාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් ලක්දිව බුදුදහම ප්‍රචලිත වීමටත් පෙර යුගයේ සිට ලක්දිව නාට්‍ය කලාවක් වූ බව සිතිය හැකි ය. භාරතයත් ශ්‍රී ලංකාවත් අතර ක්‍රිස්තු පූර්ව 3 සියවසේ සිට දේශපාලනික හා සංස්කෘතික වශයෙන් සෘජු සම්බන්ධතා පැවතිණි. ලිඛිත මූලාශ්‍රය, ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක මගින් ඒ සබඳතා මැනවින් තහවුරු කොට ඇත. භාරතයෙන් ලක්දිවට පැමිණි, ඓතිහාසික වශයෙන් ලේඛනගත වූ මුල් ම ආර්ය ජන කණ්ඩායම ලෙසින් සැලකෙන්නේ විජය කුමාරයා ඇතුළු පිරිවර යි. (මහාවංස, 6 පරිච්ඡේදය, 46, 47 ගාථා) මොවුහු උත්තර භාරතයෙන් මෙහි පැමිණියහ යි කියැ වේ. (ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 6 පරිච්ඡේදය බලන්න) විජය කුමාරයා උත්තර භාරතීය රාජකීයයෙක් වූ බැවින් ඔහු මෙහි පැමිණෙන විට දියුණුවට පත් නාට්‍ය කලාවක් එවක භාරතයේ පැවති හෙයින් නාට්‍ය පිළිබඳ අවබෝධයක් ඔවුන් සතු ව තිබූ බවට සැකයක් නැත.

පඬුවස්දෙව් රජුගේ මුණුබුරු පණ්ඩුකාභය කුමරුවා තම මාමාවරුන්ගෙන් ආරක්ෂා වීම සඳහා සැඟවී සිටි කාලයේ පණ්ඩුල ග්‍රාමයෙහි විසූ වේදයෙහි නිපුණ පණ්ඩුල නම් බ්‍රාහ්මණයාගෙන් ශිල්පශාස්ත්‍ර උගත් බව කියැවේ. (මහාවංශ 10පරි. 20-21ගාථා) මේ කරුණු අපට පැහැදිලි කර දෙන්නේ වේදයෙහි පාරප්‍රාප්ත වූ පණ්ඩුල බ්‍රාහ්මණයා වේදය ආශ්‍රිත ව නිර්මාණය වූ භරත මුනිවරයාගේ නාට්‍යශාස්ත්‍රය පිළිබඳ මනා දැනුමෙන් යුතු ව සිටි අයෙකු බවත්, ලක්දිව සමග උත්තර භාරතය හා දක්ෂිණ භාරතයේ රාජ්‍ය සම්බන්ධතා ආරම්භයේ සිට පැවති බැවින් එවකට භාරතයේ ප්‍රචලිත ව පැවති නාට්‍ය කලාව පිළිබඳ මනා අවබෝධයක් අතීතයේ සිට ම ලාංකිකයන් සතු ව පැවතෙන්නට ඇති බවත් ය.

### ප්‍රාග් බෞද්ධ සමයේ සාධක



අතීතයේ පටන් ලක්දිව දියුණු සෞන්දර්ය කලාවන්ගෙන් යුක්ත වූ බවට සාක්ෂ්‍ය ඓතිහාසික ලේඛන සහ පුරාවිද්‍යාත්මක සාධක මගින් ඉදිරිපත් කළ හැකි ය. ප්‍රාග් බෞද්ධ යුගයේ දී සංගීතය, නෘත්‍යය සහ නාට්‍ය ලක්දිව පැවති බවට සාධක